

# සිංහබාහු
## අද්භූත කාව්‍ය රස මිහිර

**විජේරත්න පතිරාජ**
**කථිකාචාර්ය - කොළඹ විශ්ව විද්‍යාලය ශ්‍රීපාලි මණ්ඩපය**



පොසොන් උදානය පාදක කොටගත් සිංහල බොදු ගී සරණියෙහි අරුමැසිය විමසා බැලූ අපගේ පසුගිය ලිපියෙන් මතුවූයේ මහින්දාගමනය පිළිබඳ පුරාවෘත්තය කිනම් කෝණ ඔස්සේ ගේය පද රචකයන්ගේ අවධානයට යොමු වී ඇත් ද යන්නයි. රටක කතන්දර කලාව හෝ පුරාවෘත්ත කලාව හෝ එරටෙහි සංස්කෘතික උරුමයන්ගේ කෝෂ්ඨ ග්‍රන්ථ ලෙස සැළකෙන්නේ රටක විවිධ කලා අනන්‍යතාවන් බිහිවීමට ඒ මූලාශ්‍ර පාදක වන බව පෙනී යන හෙයිනි. මහාවංශය ප්‍රමුඛ අපේ වංශකතාවල එන තොරතුරු අපේ ඉතිහාසයටත් සාහිත්‍යයටත් විවිධ ආකා-ාරයෙන් බලපා ඇති බව විමසා බැලීමේදී සිංහල ජාතිය සමාරම්භ වූවා යයි සැළකෙන විජයාවතරණයට පවා නෑකම් කියන සිංහබ-ාහු පුරාවෘත්තය ප්‍රමුඛස්ථානය ගනී. එම පුරාවෘත්තය පාදක කොටගත් නිර්මාණ අදත අද්විතීය සම්භාව්‍ය ප්‍රතිනිර්මාණය ලෙස සිංහබාහු දෘෂ්‍ය කාව්‍යය හඳුන්වා දිය හැකිය.

ශ්‍රී ලංකාවේ නූතන සිංහල නාට්‍යකලාවේ හැරවුම් ලක්ෂය ලෙස විචාර අවධානයට යොමුවූයේ 1956 දී මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ මනමේ නාට්‍යයයි. එය ජාතක කථා සාහිත්‍යයේ චුල්ල ධනුද්ධර ජාතකය පදනම්ව අපගේ නාඩගම් සම්ප්‍රදාය පුනරුත්ථාපනය අරභයා සාක්ෂාත් කරගත් අපූර්ව පර්යේෂණ නිර්මාණයක් විය. සරච්ච-න්ද්‍ර මහැදුරුතුමා 1960 දී මනමේ අතික්‍රමණය කරමින් විශ්වසම්භාවනාවට ලක්කරමින් සිංහබාහු නාටයය ජාතියේ අසමසම දෘෂ්‍ය කාව්‍යය බවට පත්කිරීමට පුණ්‍යවන්ත වූහ. එම සිහබාහු නාට්‍යය ප්‍රථම වතාවට ඕස්ට්‍රේලියාවේ ඩජෝර්ජ්වුඩ් ප්‍රසංග කලා රඟහලේදී පසුගිය ජිනි 3 දින වේදිකාගත වීම එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ 103 වන උපන්දිනය සැමරීමද යෙදී තිබුණු අතර එතුමාගේ නාට්‍ය තවම ජීවත්කරන කලා ශිල්පිනී ලලිතා සරච්චන්ද්‍ර මැතිණිය ප්‍රමුඛ නාට්‍ය කණ්ඩායමට නොමඳ ප්‍රේක්ෂක ප්‍රණාමයක් හිමිවීමත් විශ්ව විද්‍යාල කාලය ප්‍රමුඛ පුරා වසර 6 ක් පමණ කාලයක් සිංහබාහු නාට්‍යයේ ගායකයකු හා වේදිකා පරිපාලනයට සම්බන්ධ වූ මා හටද මේ මාහැඟි අවස්ථාව සුන්දර අතීත ස්මරණයක් වූ හෙයින් සිංහබාහු නිර්මාණයේ විශිෂ්ටත්වය ගැන විමසා බැලීමට මෙය මාහැඟි අවස්ථාවක් යයි හැඟෙයි.

සිංහබාහු කථාවස්තුව පුරාවෘත්තවල කිනම් ආකාරයට රචනාවී ඇතත් කියවා රස විඳීමකට වඩා ඇසින් බලා රසවිඳින දෘෂ්‍යකාව්‍යයක් බවට පත්කර ගැනීමේදී එහි කලාත්මක ප්‍රවේශය දෘෂ්ඨි කෝණ කීපයක් ඔස්සේ විකාශය කිරීමට ගත් වෑයම මෙහිදී විමසා බැලීම වැදගත් වේ. එය සිංහල වර්ගයාගේ සම්භවය පිළිබඳ ඓතිහාසික පුරාවෘත්තයක් වීම යනු එක් වටිනාකමක් පමණකි. එහෙත් සරච්චන්ද්‍රයන් එම කතා පුවතෙහි ඇති විශ්ව සම්භාව්‍ය ස්වරූපය විමසීම සඳහා එහි අන්තර්ගතය ප්‍රතිනිර්මාණය කර ඇති ආකාරය අධ්‍යයනය කිරීම එම නිර්මාණයේ අර්ථ සූචනයේ වටිනාකම පසක්කර ගැනීමක්වන්නේ යඳ සිංහබාහු නාටකය සිංහල නාට්‍ය වංශ කතවේ සන්ධිය අවස්තාවක් බවටත් එය නාට්‍යධර්මී සම්ප්‍රදායේ විශිස්ටතම නිර්මා-ණයක් ලෙසටත් පත්වීමට මුල් වූයේ නාඩගම් ශෛලියේ නවීකෘත අංග කීපයක්ද කථාවින්‍යාසයේ නවීකරණයට අත්හදා බැලීමක් ලෙස එළිදැක්වීට සිතා මතා ගත් විලාසය හේතුකොට ගනෙය. එහෙයින් සිංහබාහු නාටකය පිළිබඳව ශාස්ත්‍රීය විමසා බැලීමකදී එය විද්‍යාත්මක දෘෂ්ඨි කෝණයකින් විමසා බැලිය යුතු වන්නේය.

මහා වංශයෙහි එන පරිදි පුරාවෘත්තමය කථා පුවත අපට මෙසේ සංක්ෂිප්ත කළ හැකි යඳ

දඹදිව වංග දේශයේ අගරජුට හා එම මෙ-හෙසියට සිටි සුරූපී දූ කුමරිය සුප්පාදේවී නම් වූවා ය. ඇය වැඩුණු කළ සිංහරාජයකු හා සමග සහවාසය සිදුවන බවට නිමිත්ත පාඨකයෝ අදහස් පළකළහ. ඕ තොමෝ තමාට කැමති කැමති පිළිවෙලට හැසි-රුණාහ. දිනක් මගධ රාජ්‍යය බලා යන වෙළඳ ගැල් සමූහයකට එක් වූ ඕ අතරමගදී සිංහයකුගේ අතවරයකට මුහුණ පෑවා ය. සිංහයා දුටු ගැල්කරුවෝ හිස් ලූ ලූ අත දිවූහ. එහෙත් මෙම කුමරියසිංහයා දෙසට දිව ගියා ය. සිංහයාද දුරදීම ඇය දැක නගුට සලමින් ඇය වෙත පැමිණියේ ය. ඕ ආශාවෙන් සිංහයාගේ ශරීරාවයන් අත ගෑවා ය. සිංහයා සමග වනයේ සහවා-සයෙන් පුතකු හා දුවක යන නිඹුල් දරුවන් දෙදෙනෙක් ඇයට ලැබුණාහ. පුතාගේ අත් පා සිහයකුගේ මෙන් වූ හෙයින් ඔහුට සිංහබාහු යනුවෙන් ද දුවට සිංහ සීවලී යනුවෙන්ද නම් තබන ලදී. සිංහබාහු කුමරා සිය පියාණන් නැති වේලෙහි මෑණියන්ද නැගණියන්ද කැටුව ලෙනින් පළාගියේ ය. සිංහයා සිය දරුවන් මෙන්ම බිරිඳද නොමැතිව ශෝකයෙන් පසල් දනව් වැදුණෝය. සිංහබාහු කුමරා සිය පියාණන් වූ සිංහයා මරා කේසර සහිත හිස ඔසවාගෙන වගුරටට ගියේ ය. ඔහු වගුරටේ රජකම ලබා තම සොහොයුරිය වූ සිංහසීවලී බිරිඳ හැටියට ගෙන රජකම් කලේ ය. (නාට්‍යදෘෂ්ටි හා රත්නාවලී - මහාචාර්ය ඇම් එච් ගුණතිලක)

ජනවහරේ එන මෙවන් අනුවේදනීය මිථ්‍යා කථාවස්තුවක් විශ්ව සම්භාවනීය නාට්‍ය නිර්මාණයක් බවට පත්කිරීමේදී මතුවන ගැටලු කීපයක් විසෙඳන ආකාරයට කථා වින්‍යාසය සකස් විය යුතු වීමත් ගද්‍යයෙන් රචිත කථා පුවත නාටකීය රචනාවක් වීම සඳහා කාව්‍යමය සංවාදවලින් චරිත ගොඩ නැංවීමත් අභියෝගයක් විය. සිංහබාහු ගේ පියා මිනිසකු නොව සිව්පාවෙකි. කුමරියකට ඔහුට දාව දරුවන් ඇතිවිය හැකිද? එම කියමන සාධාරණ කළ හැක්කේ කෙසේද? මනුෂ්‍ය හැඟීම් සහිතව අපූර්ව සිද්ධි මාලාවක් සකස් කිරීමට සරච්චන්ද්‍රයන් දක්වා ඇති ප්‍රතිභාණය නාට්‍යය පුරාම දිස්වෙයි. සිද්ධි මාලාවේ වැදගත්කම පමණක් නොව අන්තර්ගතයෙන් ප්‍රකට වන විශ්වශනීය ගුණය ආරක්ෂා කිරීමට කතන්දරයෙන් ඔබ්බට ගිය මානවීය සම්බන්ධතාවක් ගොඩනැගීමේදී පවුල් සංස්ථාවක් තුළ වැඩිහිටි පරම්පරාව හා තරුණ පරම්පරාව අතර හට ගන්නාවූ පරස්පරයන් හේතුකොටගෙන ඇතිවන්නාවූ බෙදවාචකයේ සජීවමාන කිරීමට කථාව ගෙත්තම් කරන ආකාරයක් අපට පෙනී යයි. එහි නිරූපණය වන සිංහයා මධ්‍යම පන්තියේ පියකු සංකේතවත් කරන්නකි. පවුලක ඇලීම් බැඳීම් විපර්යාසයට භාජනය වනවිට භාවාතිශය ආදරය දෝලනය වන ආකාරය තීව්‍ර මනෝ විශ්ලේෂණයකට භාජනය කරන තේමාවක් බවට කථාව පරිවර්තනය කරගත් බව දැකිය හැකිය. නාට්‍යය සහෘද ආකර්ශ නයට ලක්වීමට ප්‍රධාන නිමිත්ත එයම විය.

සිංහබාහු නාට්‍ය පෙළ නිර්මාණය කිරීමේ දී නාඩගම් ක්‍රමයට චරිත හඳුන්වාදීමෙන් පසුව නාට්‍ය ආරම්භවන්නේ තරුණ වියට පත්ව ඇති සිංහබාහු පුත්‍රයා හා මහලු සිංහ පියා අතර සැරිසරණ ව්‍යාකූල මානසික ලෝකවල විචිකිච්ඡාව ප්‍රශ්නකරන ගැටුමෙන්ය. ඓතිහාසික කථා පුවත සුප්පාදේවි ප්‍රමුඛ කොටගෙන ගෙතී ඇතත් නාට්‍ය පෙළ සිංබාහු චරිතය මුල්කොට ගෙන නිර්මාණය වන හෙයින් නාට්‍යය පුරාම මෙම පියපුතු ගැටුම රිද්ම ගතවෙයි. සිංහයාට වනාන්තරය ඔහුට හුරුපුරුදු ලෝකයවුවත් සිංහබාහුට ගල්ලෙන සිරගෙයකි. මේ ගැටුම දෝලනය වන්නේ භාවපූර්ණ නාට්‍යමට ප්‍රබන්ධවලිනි. පොතේ ගුරුගේ චරිත හඳුන්වාදීමෙන් පසුව සිංහබාහු මවගෙන් ප්‍රශ්න කිරීමමෙන් කථා විකාශය රංගයක් බවට පත්වෙයි.

කිම්ද මෑණියනි මා අසනා
කන් නොදෙන්නේ පැනය ටා
මේ ලෙසේ හිරකර වෙසෙන්නේ
කියනු කෙලෙසද සෑම දා

සිංහබාහු දිගින් දිගට මෙසේ ගල්ලෙනක සිර වී විසීමට හේතු විමසයි. සිංහ සීවලීද ඒ ප්‍රශ්න කිරීමට එක්වෙයි. එහෙත් මව සත්‍යය වසන් කරමින් පියා වනයට අධිරාජයකු බවත් ඔහු සියල්ල රක්ෂාකරන බවත් ඔහුගෙන් ඒ ගැන ප්‍රශ්න නොකරන ලෙසටත් ඉල්ලා සිටියි. සිංහබාහුගේ අසහනය වැඩිවීමට මවගේ පිළිතුර තවත් හේතුවක් වෙයි. ඔහු මව්පියන් මගහැරීම ප්‍රශ්නයක් වෙයි. සිංහයා දරුවන් කැඳවා ඔවුන්ගේ සිතැගියාව ප්‍රශ්න කරයි. සිංහබාහු මෙහිදී තමාට ගල්ලෙන තුළ දැනෙන බිය සංකා නොපැකිළව ප්‍රකාශකරන විට පියා ඒවා වළක්වන්නේ තර්ජන ස්වරූපයකිනි. මෙසේ